ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**මහාමාර්ග අමාත්‍යාංශය**

**මාර්ග සංවර්ධන අධිකාරිය**

# රැකියා ඇබෑර්තු

මාර්ග සංවර්ධන අධිකාරියේ පහත සඳහන් රැකියා පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) HM 1-3

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

1) විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය / මූල්‍ය / ව්‍යාපාර කළමණාකරණය / වාණිජ උපාධියක් හෝ ජාතික උසස් ගණකාධිකරණ ඩිප්ලෝමාවක් තිබීම.

සමඟ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අනුව පිළිගත් වෘත්තීමය වරලත් ආයතනයක සමාගම් සාමාජිකයෙකු වීම.

සහ

අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමණාකරණ මට්ටමේ" තිබීම.

2) ගණකාධිකරණය / මූල්‍ය / ව්‍යාපාර කළමණාකරණය / වාණිජ ක්ෂේත්‍රයන් තුළ පිළිගත් වෘත්තීමය වරලත් ආයතනයක පූර්ණ / අර්ධ සමාජිකයෙකු වීම.

සහ

අවම වශයෙන් අවුරුදු 17 ක පළපුරුද්දක් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමණාකරණ මට්ටමේ" තිබීම.

**වැටුප් ප්‍රමාණය**

**HM 1-3 - රු.86,865 - 2,270 x 15 - 120,915/-** + රජය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද අනෙකුත් සියලු දීමනා

**වයස් සීමාව**

අවුරුදු 35 ට වඩා නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 55 ට වඩා නොවැඩි විය යුතුය.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

- අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට 12% ක් සහ සේවකයා විසින් 8% ක දායකත්වයක් ලබාදෙන අතර සේවක භාරකාර අරමුදලට 3% ක අතිරේක දායකත්වයක් ලබාදෙනු ලැබේ.
- රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ අංක 1/2015 සහ 1/2015 (i) අනුව අනුමත කරන ලද ඉන්ධන දීමනා සහ ගමනාගමන දීමනා සමඟ පවරන ලද වාහනයක් ලබාදෙනු ලැබේ.
- රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල සහ අධිකාරී තුළ සේවය කරන අයදුම්කරුවන් ආයතනයේ අදාළ නිලධාරීන් මඟින් අයදුම්පත් යොමු කළ යුතු ය.
- අයදුම්කරුවන් තහවුරු කරගැනීම සඳහා අයදුම්පත්‍රයේ ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය සහ දුරකතන අංක ඇතුළත් කර එවිය යුතුය.
- අධ්‍යාපනික සහ අනෙකුත් සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු ය.

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කර **2020.09.02** වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ (පරිපාලන) වෙත පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්**

**මාර්ග සංවර්ධන අධිකාරිය**

**පළමුවන මහල, "මගනැගුම මහමැඳුර", අංක 216,**

**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත,**

**බත්තරමුල්ල.**